# අධ්‍යාපන අමාත්‍යාංශය
# கல்வி அமைச்சு
# Ministry of Education

'ඉසුරුපාය', බත්තරමුල්ල, ශ්‍රී ලංකාව.
'இசுருபாய', பத்தரமுல்ல, இலங்கை.
'Isurupaya', Battaramulla, Sri Lanka.
+94112785141-50 +94112785818
info@moe.gov.lk www.moe.gov.lk


මගේ යොමුව / எனது இல. / My Ref. ED/01/09/06/05/01/2020(1)
ඔබේ යොමුව / உமது இல. / Your Ref.
දිනය / திகதி / Date 2020.07. 28

පළාත් ප්‍රධාන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන ලේකම්වරුන්,
පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්,
පරිවේණාධිපතිවරුන්,
විදුහල්පතිවරුන් වෙත

**Covid - 19 වසංගතය හේතුවෙන් නිවාඩු ලබා දුන් රජයේ පාසල් හා රජය අනුමත පෞද්ගලික පාසල් නැවත ආරම්භ කිරීමේ ක්‍රියාවලිය.**

උක්ත ශීර්ෂයෙන් යුතු ව, මා විසින් ඔබ වෙත යොමුකළ අංක ED/01/12/06/05/01 සහ 2020.06.10, 2020.06.22 සහ 2020.07.23 දිනැති ලිපි ද, උක්ත ලිපිවල ම දිගුවක් වූ අධ්‍යයන කාර්යමණ්ඩලවල පැමිණීම හා පිටවීම පිළිබඳ සමාංක දරන 2020.07.07 දිනැති ලිපියට ද වැඩිමනත් වශයෙනි.

ඒ අනුව, Covid 19 වසංගත තත්ත්වය හේතුවෙන් වසා දමා විවෘත කළ පාසල්, සෞඛ්‍ය බලධාරීන්ගේ නිර්දේශ මත නැවත නිවාඩු ලබා දීමෙන් අනතුරුව ආරම්භ කිරීමේ ක්‍රියාවලිය, අංක FHB/SHU/COVID Let 2020 දරන 2020.04.29 දිනැති " **කොවිඩ් 19** වසංගත රෝග ව්‍යාප්තිය වැලැක්වීම පිළිබඳ පාසල් පරිශ්‍ර තුළ පැවතිය යුතු සූදානම සඳහා වූ මාර්ගෝපදේශයේ" නියම ප්‍රකාර ව සෞඛ්‍ය පිළිවෙත් අනුගමනය කරමින්, පහත ක්‍රියා පටිපාටිය අනුව සිදු කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශය තීරණය කර ඇත.

**1.0 පාසල් අධ්‍යාපන කටයුතු ආරම්භ කිරීම.**

| | |
|---|---|
| **11,12 හා 13 ශ්‍රේණි පමණක් ආරම්භ කිරීම** | **ජුලි 27 – 31 දක්වා** |
| **මැතිවරණය පැවැත්වීම සඳහා සියලු ම පාසල් සඳහා නිවාඩු ලබාදීම** | **අගෝස්තු 03 - අගෝස්තු 07** |
| **1 සිට 13 දක්වා වන සියලු ම ශ්‍රේණි ආරම්භ කිරීම** | **අගෝස්තු 10** |
| **දෙවන වාර පාසල් නිවාඩුව** | **ඔක්තෝබර් 09 සිට නොවැම්බර් 16 දක්වා** |
| **5 ශ්‍රේණිය ශිෂ්‍යත්ව විභාගය පැවැත්වීම** | **ඔක්තෝබර් 11** |
| **අ.පො.ස. (උසස් පෙළ) විභාගය පැවැත්වීම** | **ඔක්තෝබර් 12** |

- **11,12,13 ශ්‍රේණි පමණක් පවත්වාගෙන යන කාල වකවානුව තුළ (2020 ජුලි 27 සිට 2020 ජුලි 31 දක්වා) අදාළ පන්තිවල ඉගැන්වීම් සිදු කරන ගුරුවරුන් සහ විශේෂ රාජකාරි පවරා ඇති ගුරුවරුන් පමණක් පාසලට ගෙන්වා ගත යුතු ය.**

2.0 2020.08.10 දින සිට පාසල් ආරම්භ කිරීමෙන් පසු ව පහත ආකාරයට සිසුන් පාසලට ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු ය.

- පාසලේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 200 හෝ ඊට අඩු, මීටරයක ශිෂ්‍ය පරතරය සහිත ව පන්ති පවත්වා ගෙන යා හැකි නම්, සියලු ම ශ්‍රේණිවල සිසුන්ට සාමාන්‍ය පරිදි පාසල විවෘත කළ යුතු ය.

- පාසලේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 200 ට වැඩි, 1-5 පන්ති පැවැත්වෙන පාසල් සහ ද්විතියික පාසල්වල ප්‍රාථමික අංශ පහත ක්‍රමවේදය අනුගමනය කරමින් සිසුන්ට පාසල විවෘත කළ යුතු ය.

| නියමිත දිනය | කැඳවීමට නියමිත ශ්‍රේණි | පාසල් කාලය |
|---|---|---|
| සඳුදා | 1 හා 5 ශ්‍රේණි | සාමාන්‍ය පරිදි වේ. |
| අඟහරුවාදා | 2 හා 5 ශ්‍රේණි | |
| බදාදා | 3 හා 5 ශ්‍රේණි | |
| බ්‍රහස්පතින්දා | 4 හා 5 ශ්‍රේණි | |
| සිකුරාදා | 4 හා 5 ශ්‍රේණිය | |

**පාසලේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 200 ට වැඩි ද්විතියික පාසල්**

| නියමිත දිනය | කැඳවීමට නියමිත ශ්‍රේණි | පාසල් කාලය |
|---|---|---|
| සඳුදා | 6,10,11,12 හා 13 ශ්‍රේණි | 6,7,8 හා 9 ශ්‍රේණි සඳහා පාසල් කාලය පෙ.ව. 7.30 සිට ප.ව.1.30 |
| අඟහරුවාදා | 7,10,11,12 හා 13 ශ්‍රේණි | |
| බදාදා | 8,10,11,12 හා 13 ශ්‍රේණි | |
| බ්‍රහස්පතින්දා | 9,10,11,12 හා 13 ශ්‍රේණි | |
| සිකුරාදා | 9,10,11,12 හා 13 ශ්‍රේණි | 10,11,12 හා 13 ශ්‍රේණි සඳහා පාසල් කාලය පෙ.ව. 7.30 සිට ප.ව. 3.30 |

## 3.0 විවේක කාලය

- ප.ව. 1.30ට අවසන් වන පන්ති සඳහා විවේක කාලය සාමාන්‍ය පරිදි වේ.
- ප.ව.3.30 දක්වා පාසල් කාලය පැවැත්වෙන ශ්‍රේණිවල සිසුන් සඳහා මිනිත්තු 20ට නොවැඩි විවේක කාල දෙකක් ලබා දීමට කටයුතු කළ යුතු ය.

## 4.0 අධ්‍යයන කාර්යය මණ්ඩලය

- 2020.08.10 දින සිට අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සියලුම දෙනා රාජකාරියට වාර්තා කළ යුතු අතර, ඔවුන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියට අදාළ කටයුතුවලට අමතර ව සුපරීක්ෂණ කාර්යය, පැවරුම් පරීක්ෂා කිරීම, සෞඛ්‍ය හා විනය ආරක්ෂණ කටයුතුවල වගකීම් පවරා දීම සිදු කළ යුතු ය.

- ප.ව. 3.30 දක්වා කාලසටහන් හිමි ගුරුවරුන් හැර අනෙකුත් සියලු ම ගුරුභවතුන්ගේ රාජකාරී වේලාව වන්නේ පෙ.ව. 7.30 - ප.ව. 1.30 දක්වා වේ.

## 5.0 පන්ති කළමනාකරණය

පුද්ගල දුරස්ථභාවය හේතුකොට ගෙන පන්ති සැකසීමේ දී සියලු ම පන්ති කාමර සහ වෙනත් විෂය කාමර, විද්‍යාගාර ආදිය භාවිතයට ගත යුතු අතර, හොඳින් වාතාශ්‍රය ලැබෙන එළිමහන් පන්ති කාමර ද සකස් කළ හැකි ය.

**6.0 අනධ්‍යයන කාර්යය මණ්ඩලය**

අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ සියලු ම දෙනා ද සුපුරුදු පරිදි රාජකාරිය සඳහා වාර්තා කළ යුතු ය.

**7.0 විභාග සහ පැවරුම්**

- පාසල් පාදක ඇගයීම් සහ අ.පො.ස. (උසස් පෙළ) අනාවරණ පරීක්ෂණ හැර වාර විභාග හෝ වෙනත් විභාග පැවැත්වීම සිදු නොකළ යුතු ය.

- සතියට එක් වතාවක් පමණක් පාසල් පැමිණෙන සිසු සිසුවියන් සඳහා තම නිවෙස්වල සිට සිදු කිරීමට පැවරුම්, අභ්‍යාස ආදිය ලබා දීමට කටයුතු කළ යුතු අතර අදාළ ගුරුභවතුන් ඒවා පරීක්ෂා කර සිසුන්ගේ දැන ගැනීම සඳහා ඉදිරිපත් කළ යුතු ය.

**8.0 ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතු**

පාසල් ක්‍රීඩා හා විෂය සමගාමී කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ED/01/12/06/05/01 හා 2020.06.10 දිනැති ලිපියේ 2.10 වගන්තියේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු ය.

**9.0 පාසල් ආපනශාලා පවත්වාගෙන යාම**

Covid – 19 රෝග තත්ත්වය පාලනය වී ඇති බවට සෞඛ්‍ය අංශ මඟින් තහවුරු කරන තුරු ආපන ශාලා විවෘත කිරීමෙන් වැළකිය යුතු ය.

ලබා දී ඇති මෙම උපදෙස්වලට පරිබාහිර ව පළාත් අධ්‍යාපන ලේකම්, පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ කලාප අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට වෙනත් උපදෙස් නිකුත් නොකරන ලෙසට දන්වා සිටින අතර සියලු ම විදුහල්පතිවරුන් මෙම උපදෙස් එලෙස ම ක්‍රියාත්මක කිරීමට වගබලා ගත යුතු බව අවධාරණය කරමි.

එන්.එච්.එම්.චිත්‍රානන්ද
ලේකම්
අධ්‍යාපන අමාත්‍යාංශය